# අඩුවැඩියක් නැති ඉංගිරිසිය

භාෂාවක් යනු සංස්කෘතියක් තුළ නිර්මාණය කෙරෙන්නකි. භාෂාවක් යන්න සංස්කෘතියක ඉතා වැදගත් අංගයක් වන නමුදු, සමහරවිට වැදගත් ම අංගය විය හැකි නමුදු, එය සංස්කෘතියෙහි අංගයක් පමණකි. භාෂාව මෙන් ම සංස්කෘතිය ද නිර්මාණය කෙරෙන්නේ මිනිසුන් (මිනිසා) විසිනි. මිනිසා හා භාෂාව, භාෂාව හා සංස්කෘතිය, සංස්කෘතිය හා මිනිසා අතර ඇත්තේ චක්‍රීය සම්බන්ධ ය. එසේ දෙක බැගින් නොගෙන අවශ්‍ය නම් මිනිසා, භාෂාව හා සංස්කෘතිය එකට ගෙන ඒවා අතර ඇති චක්‍රීය සම්බන්ධය ගැන ද අධ්‍යයනය කළ හැකි ය. එයටත් එහා ගොස් සංස්කෘතියෙහි වෙනත් අංග වූ සංගීතය, විද්‍යාව ආදිය ද එකට ගෙන ඒ සියල්ල අතර ඇති චක්‍රීය සම්බන්ධය ගැන කතා කළ හැකි ය. මේ සියල්ල එකිනෙකට බැඳී ඇත්තේ චින්තනයෙන් ය. එහෙත් මෙයින් කියැවෙන්නේ ඒවා චින්තනය මත බල නොපාන බව නොවේ. චින්තනය ද සංස්කෘතියෙහි වෙනස්වීම් හේතුකොටගෙන වෙනස් වෙයි. භාෂාව වෙනස් වීම නිසා ද චින්තනය ද වෙනස් වෙයි. භාෂාව වෙනස් කිරීමෙන් චින්තනය වෙනස් කළ හැකි ය. භාෂාව පමණක් නොව සංගීතය වැනි වෙනත් සංස්කෘතිකාංගයක් වෙනස් කිරීමෙන් ද චින්තනය වෙනස් කළ හැකි ය. එහෙත් මෙයින් කියැවෙන්නේ ඒ සෑම වෙනසක් සමග ම චින්තනය වෙනස්වන බව නොවේ. එහෙත් චින්තනයෙහි වෙනස්වීමක් සමග සංස්කෘතිය ද එහි විවිධ අංග ද වෙනස් වෙයි. බටහිරයන්ට චක්‍රීය සංකල්පය නොමැති බැවින් ඔවුහු සෑම දෙයක් ම යම් මූලික දෙයකට ඌනනය කරති. චක්‍රීය සංකල්පය ඒක රේඛීය චින්තනයක දක්නට නොමැත. බටහිරයන්ගේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ඒක රේඛීය වෙයි. එබැවින් ඒ චින්තනයෙන් බැඳුණු ඔවුන්ගේ සංස්කෘතියෙහි ඌනිතවාදය දක්නට ඇත. බටහිරයන් මිනිසා භාෂා නිර්මිතයක් යැයි පවසන විට හා විට්ගන්ස්ටයින් විද්වතා දර්ශනය භාෂාවට ඌනනය කරන විට බල පාන්නේ මේ ඒක රේඛීය චින්තනය හා ඌනිතවාදය ය.

මාක්ස්වාදීහු සංස්කෘතිය ආර්ථිකයට ඌනනය කිරීමට උත්සාහ කළහ. එහෙත් එය කළ නොහැක්කකි. සංස්කෘතිය ආර්ථිකයෙන් යම් පමණකට තීරණය වන අතර ආර්ථිකය ද යම් පමණකට සංස්කෘතියෙන් තීරණය වෙයි. ධනපති ආර්ථිකය චීනයේ හෝ වෙනත් රටක ඇති නොවී බටහිර, විශේෂයෙන් ම එංගලන්තයේ බිහි වූයේ ඇයි? සියල්ල ද්‍රව්‍යයට ඌනනය කිරීමට පුරුදු වූවකු අනෙක් රටවල ධනපති ක්‍රමය බිහිවීම සඳහා අවශ්‍ය විෂයමූල තත්ත්වය නොපැවති බව කියනු ඇත. එහෙත් මේ විෂයමූල තත්ත්වය යනු කුමක් ද? ධනපති පංතියක බිහිවීම ද? යුරෝපීය වැඩවසම් ක්‍රමය කඩා වැටුණේ ඇයි? වෙළෙඳ පංතියක් බිහි වූයේ කෙසේ ද? එහි දී බටහිර යුදෙව් ක්‍රිස්තියානි (කතෝලික නොවන ක්‍රිස්තියානි) සංස්කෘතිය කෙසේ බල පෑවේ ද? බටහිර විද්‍යාවේ හා තාක්ෂණයේ යම් ප්‍රගතියක් නොමැතිව ධනපති ක්‍රමය ඇති වීමට ඉඩක් නැත. ධනපති ක්‍රමය විසින් බටහිර විද්‍යාව හා තාක්ෂණය බිහි කරනු ලැබුවා නොවේ. ධනපති ක්‍රමයට බටහිර විද්‍යාව හා තාක්ෂණය මෙන් ම යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය ද අවශ්‍ය විය. ලෝකය මිනිසා වෙනුවෙන් මවා හෝ මැවී හෝ ඇත යන්න හා මිනිසා ස්වභාව ධර්මයාගේ ස්වාමියා ය යන සංකල්ප නොමැති ව ධනපති ක්‍රමය බිහිවිය හැකි නොවේ. මේ සංකල්ප අයත්වන්නේ සංස්කෘතියට ය. ඒ සංකල්ප යුරෝපයේ බිහි වූයේ ධනපති ක්‍රමය ආරම්භ වීමට ද පෙර ය. ධනපති ක්‍රමය විසින් සූරාකනු ලබන්නේ මිනිස් ශ්‍රමය පමණක් නොවේ. මාක්ස්වාදයට හසුවන්නේ මේ මිනිස් ශ්‍රමය සූරාකෑම ය. එහෙත් ධනපති ක්‍රමයට පළමුවෙන් ම ස්වභාව ධර්මය සූරාකෑමට සිදුවෙයි. ස්වභාව ධර්මය සූරාකෑමෙන් තොරව ධනපති ක්‍රමයට පැවැත්මක් නොමැත. ධනපති ක්‍රමය තුළ පරිසරය සුරැකීම සුරංගනා කතාවක් පමණ ය. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තන ආධිපත්‍යය හා ධනපති ක්‍රමය තිබෙනතාක් පරිසරය ද ස්වභාව ධර්මය ද ක්‍රමයෙන් විනාශ වෙයි.

බටහිරයන්ට සැමදාමත් ප්‍රශ්නය වී ඇත්තේ යමක් හෝ යමකු යනු තවත් බාහිර දැයකින් හෝ බාහිර අයකුගෙන්, එනම් වෙනත් බාහිර දැයක් හෝ බාහිර අයකු හෝ මගින් තේරුම් ගැනීම ය. නිව්ටන් පඬිවරයා වස්තුවක චලිතය බාහිර බලය මගින් තේරුම් ගැනීමට උත්සාහ කෙළේ ය. බාහිර බලයක් නැති විට වස්තුවක් යම් අවස්ථිති සමුද්දේශ රාමුවකට සාපේක්ෂ ව එක්කෝ ඒකාකාර ව චලනය වන්නේ ය නැත්නම් නිශ්චල ව පවතින්නේ ය යැයි ඔහු කියා සිටියේ ය. මාක්ස්වාදයෙහි මිනිසා බාහිර ආර්ථිකය විසින් පාලනය කෙරෙන සත්ත්වයකු බවට පත්වෙයි. ලැකාන් පඬිවරයා ආත්මීයතාව බිහිවීම පුද්ගලයකු භාෂාවේ සංකේතවලට ඇතුල්වීම සමග සිදු වන්නේ යැයි කීවේ ය. ආත්මීයතාව යන්නෙහි මම යන තේරුම වෙයි. “මම” ඇතිවන්නේ, නැත්නම් බිහිවන්නේ කෙසේ ද? ආත්මීයතාව භාෂාව සමග ගැටගැසීමේ දී ද සිදුවන්නේ ආත්මීයතාව බාහිර යමකට භාර දීම ය. බාහිර වූ එනම් පුද්ගලයාගෙන්

© Prof. Nalin De Silva

බාහිර වූ භාෂාවක් නැත්නම් ආත්මීයතාවක් නැත. මෙය විකාරයක් බව කුඩා දරුවන් ගැන දන්නෝ දනිති. කුඩා දරුවෝ භාෂාවක් කතා නොකරති. එහෙත් ඔවුන්ට "මම" යන හැඟීම නැත් ද? "මම" නැතිව ඔවුහු ජීවත්වන්නෝ ද? "මම" හා මනස ඇතිවන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට සිංහල ථෙරවාද බෞද්ධ චින්තනය මත පදනම් වී දෙන ලද පිළිතුරක් ඉරිදා දිවයින සංග්‍රහයෙහි සිංහල බෞද්ධ මනස යන මැයෙන් පළ වූ ලිපියෙහි සඳහන් වෙයි. එහි බාහිර බලවේග හෝ බල නොමැති අතර චක්‍රීය චින්තනය වෙයි.

මේ සියල්ලට ම හේතුවක් ඇත. බටහිරයන් යමක් බාහිර වෙනත් දෙයක් ඔස්සේ තේරුම් ගැනීමට උත්සාහ කරන්නේ ඔවුන්ගේ සංස්කෘතීන්හි හා චින්තනයෙහි බාහිර යන්න නිතර ම සවිඥානික ව හා අවිඥානික ව කියැවෙන්නක් වන බැවිනි. බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි සියල්ල මවනු ලැබී ඇත්තේ බාහිර දෙවි කෙනකු විසිනි. සියල්ල සිදුවන්නේ මේ බාහිර දෙවියන් වහන්සේගේ කැමැත්ත පරිදි ය. මුල් ග්‍රීක චින්තනයෙහි එලෙස දෙවියන් වහන්සේ කෙනකු නැති බව පඬියකු කීමට ඉඩ ඇත. එය අමුතුවෙන් කිවයුතු නොවේ. මෙහි දී ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය නමින් හැඳින්වෙනුයේ පහළොස්වැනි සියවසෙන් පසුව බටහිර යුදෙව් චින්තනය, ග්‍රීක චින්තනය හා ක්‍රිස්තියානි (කතෝලික නොවන) චින්තනය මුසු වී නිර්මාණය කෙරුණු චින්තනයට ය. බටහිර විද්‍යාව, ධනපති ක්‍රමය ආදිය ගොඩ නැගුණේ ඒ චින්තනය පදනම් කර ගනිමිනි. ඒ චින්තනයෙහි දෙවියන් වහන්සේට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. දෙවියන් වහන්සේ පිළිබඳ සංකල්පය ඒ චින්තනයට ලැබෙන්නේ යුදෙව් චින්තනයෙනි. යුදෙව් දෙවියන් වහන්සේ හෙවත් යෙහෝවා දෙවියන් වහන්සේ තමන් හැරෙන්නට අන් සියල්ලෙහි ම මැවුම්කරුවා ය. ඒ දෙවියන් වහන්සේ මැවුනේ කෙසේ දැයි කිසි තැනක සඳහන් නොවේ. එහෙත් අන් සියල්ල ඒ බාහිර දෙවියන් වහන්සේ මත රඳා පවතී.

අයිසැක් නිව්ටන්, කාල් මාක්ස්, ඇල්බට් අයින්ස්ටයින්, යැක් ලැකාන් ආදී සියළු බටහිර පඬිවරු මේ චින්තනයෙහි ම සිය නිර්මාණ කළහ. එබැවින් ඔවුන්ට භෞතික විද්‍යාව, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, මනෝ විශ්ලෙෂණය ආදී වශයෙන් කුමන ක්ෂෙත්‍රයක වැඩකළ ද බාහිර බලවේග, බල ආදිය පිළිබඳ සංකල්පයෙන් මිදීමට නොහැකි විය. බටහිර භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව ආදියෙහි පමණක් නොව සමාජයීය විද්‍යාවන්හි හා මනෝ විශ්ලේෂණයෙහි ද පදනමෙ ඇත්තේ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ය. බටහිර පඬිවරුන්ගෙන් ඇතැමකු ඉඳහිට ඒ චින්තනයෙන් කැඩීමට උත්සාහ නොකළා නොවේ. එහෙත් ඒ සැම උත්සාහයක් ම අසාර්ථක ව්‍යාපෘතියක් ලෙස අවසන් විය. බටහිරයන්ට ඒ චින්තනයෙන් කැඩීම අපහසු බව ක්වොන්ටම් භෞතික විද්‍යාවෙහි දී හොඳින් ම පෙන්නුම් කෙරී ඇත. බටහිර පශ්චාත්නූතනවාදය යනු ක්වොන්ටම් භෞතික විද්‍යාවේ කෝපන්හේගන් අර්ථ විවරණය හා ඒ ආශ්‍රිත සාපේක්ෂතාවාද ඔස්සේ බටහිර ඉලෙක්ට්‍රොනික විප්ලවය තේරුම් ගැනීමට ගොස් අසාර්ථක වී ඇති දැනුම් පද්ධතියක් පමණකි. ඒ දැනුම් පද්ධතිය දැනටමත් යුරෝපයේ විහිළුවක් බවට පත් වී ඇත. බොරු වචන මාලාවක් යොදා ගනිමින් කෙරෙන මේ විහිළුව ක්වොන්ටම් භෞතික විද්‍යාව ආපසු සාපේක්ෂතාවාදී නොවන අර්ථ විවරණයක් කරා යත් ම බෙදවාචකයක් බවට පත්වනු ඇත.

දැන් අපි නැවතත් භාෂාව හා සංස්කෘතිය වෙත යමු. අපේ මූලික ප්‍රශ්නය වූයේ ඕනෑම භාෂාවකින් ඕනෑම දෙයක් ප්‍රකාශ කළ හැකි ද යන්න ය. ඒ ප්‍රශ්නයට අපේ පිළිතුර ඉතා පැහැදිලිව ම නැත යන්න ය. ඉංගිරිසියෙන් බුදු දහම දෙසිය හැකි නොවේ. ද්විකෝටික න්‍යාය ඉක්ම වූ ද, ප්‍රවාද නොමැති වූ ද බුදු දහම ද්විකෝටිකය තුළ වර්ධනය වූ ඉංගිරිසියෙන් ප්‍රකාශ කිරීමට ගිය වහා ම බුදු දහම ද්විකෝටිකය තුළ සිරවෙයි. බුදු දහම නොව ඇතැම් සිංහල වාක්‍ය හා වචන පවා ඉංගිරිසියෙන් ප්‍රකාශ කළ හැකි නොවේ. අඩුවැඩිය වැනි වචන හෝ යන එන ගමන් ගෙට ගොඩවැදිල යන්න වැනි වාක්‍ය හෝ ඒවාහි ඇති අදහස් ඒ සැටියෙන් ම ගෙන හැර දක්වමින් ඉංගිරිසියෙන් ප්‍රකාශ කළ හැකි නොවේ. මෙවැනි වචන හා වාක්‍ය ද්විකෝටික න්‍යායට හසු නොවෙයි. ද්විකෝටික න්‍යාය තුළ වර්ධනය වී ඇති භාෂාවල විරුද්ධ අර්ථයන් ගෙන දෙන වචන සමාස වී එකට ප්‍රකාශ නොවේ. අඩුවැඩිය යන වචනයෙහි අඩු හා වැඩි යන විරුද්ධාර්ථ ගෙන දෙන වචන දෙකක් එකට ප්‍රකාශ වෙයි. ඉංගිරිසියෙහි මෙය කියැවෙන්නේ more or less යනුවෙනි. එනම් අඩු හෝ වැඩි යන අර්ථයක් එහි වෙයි. එහි අඩුවැඩියක් ප්‍රකාශ නොවෙයි. ඉංගිරිසියෙන් නිවන ගැන නොව බුලත්විටට අඩුවැඩිය සැපයීම ගැනවත් කිව නොහැකි ය.

© Prof. Nalin De Silva

ද්විකෝටික න්‍යායෙහි යමක් එක්කෝ අඩු ය. නැත්නම් වැඩි ය. එහි මධ්‍යය බැහැර වෙයි. ද්විකෝටික න්‍යාය තුළ අඩුව හා වැඩිය එකට ගැනීම වැරදි ය. එබැවින් ඒ න්‍යාය මත පදනම් වූ භාෂාවන්හි එලෙස එකට ගැනීමක් කිනම් අරුතකින් හෝ ප්‍රකාශ වන වචන තිබිය නොහැකි ය. එවැනි අදහස් ද්විකෝටික න්‍යාය තුළ පරස්පර, විසංවාද, විරුද්ධාභාස ආදී වශයෙන් හැඳින්වෙයි. අඩුවැඩිය සැපයීම යන්න ද්විකෝටික න්‍යායෙහි පරස්පරයක් වෙයි. යන එන ගමන් ගෙට ගොඩ වැදිල යන්න යන වාක්‍යය චොම්ස්කි විද්වතාණන්ගේ ව්‍යාකරණ නීති රීතිවලට හසුවන්නේ ද යන්න ප්‍රශ්නයකි. මෙවැනි භාෂා ප්‍රයෝග පිළිබඳ ගවේෂණයක් කිරීමට දැන් කාලය පැමිණ ඇත. ඉංගිරිසි භාෂාව සිංහල භාෂාවට වඩා නිශ්චිත භාෂාවක් වන්නේ ඉංගිරිසිය එලෙස ද්විකෝටික න්‍යාය තුළ වර්ධනය වී ඇති බැවිනි.

එහෙත් ක්වොන්ටම් භෞතික විද්‍යාවේ ඇති ඇතැම් අදහස් ප්‍රකාශ කිරීමට එවැනි නිශ්චිත භාෂා බාධාවක් වෙයි. ක්වොන්ටම් භෞතික විද්‍යාවේ අංශුවකට එක්වර කිහිප තැනක පිහිටිය හැකි ය. ඒ අංශුවකට එක් නිශ්චිත පිහිටීමක් ඇත්තේ පිහිටීම දැන ගැනීම සඳහා මැනුමක් කළ අවස්ථාවක දී ය. ඔක්ස්ෆඩ් විශ්ව විද්‍යාලයෙහි මාෂල්, සිමෝන්, පෙන්රෝස් හා බෝමීස්ටර් යන විද්‍යාඥයන් ෆිසිකල් රිව්‍යු ලෙටර්ස් සඟරාවෙහි 2003 වසරෙහි සැප්තැම්බර් මස පළ කර ඇති පර්යේෂණ පත්‍රිකාවක (Physical Review Letters, 91, 130401,) ඉතාම කුඩා අංශුවලට පමණක් නොව රක්තාණුවක පමණ විශාලත්වයෙන් වූ අංශුවකට ද එක්වර දෙතැනක පිහිටිය හැකි ක්‍රමයක් ගැන සඳහන් කරති. මේ පිළිබඳ කෙටි විස්තරයක් 2003 ඔක්තෝම්බර් මස මුල් සතියෙහි න්‍යූ සයන්ටිස්ට් සඟරාවෙහි පළ කෙරී ඇත. මේ ප්‍රතිඵලවලින් බටහිර භෞතික විද්‍යාඥයන්ට ප්‍රශ්න ඇති විය යුතු වෙයි. අංශුවක් යනු කුමක් ද යන ප්‍රශ්නය ම ප්‍රධාන ප්‍රශ්නයක් ලෙස බටහිර විද්‍යාවේ පැන නැගිය යුතු නමුදු, මේ සමග ද්විකෝටික න්‍යාය පිළිබඳ ප්‍රශ්න ඇති විය යුතු නමුදු ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය තුළ සිර වී සිටින බටහිර විද්‍යාඥයන් සුපුරුදු පරිදි ප්‍රශ්නය යට ගසනු බලාපොරොත්තු විය හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva